# ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම - 2019
## සිංහල භාෂාව
## 11 පත්‍රය

**13 ශ්‍රේණිය** **කාලය පැය 03 යි**

➢ උපදෙස්
- 1 කොටසේ 1 වන ප්‍රශ්නයද, 11 කොටසේ 2,3 ප්‍රශ්නද ඇතුලුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- 1 ප්‍රශ්නයේ ඇති සියලුම අනු කොටස්වලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.
- 1 කොටස 11 කොටසේ ඇති පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

### 1 කොටස

1.එක් එක් ප්‍රශ්නයට වඩාත්ම ගැලපෙන පිළිතුර තෝරාගෙන එයට හිමි අංකය වරහන තුළ ලියන්න.

1. මූර්ධජ අක්ෂර පමණක් අන්තර්ගත වරණය තෝරන්න

1. ත, ථ, ද, ධ, න 2. ප, ඵ, බ, භ, ම
2. ට, ඨ, ඩ, ඪ, ණ 4' ක, ඛ, ග, ඝ, ඞ
5. ය, ර, ල, ව

(.......)

2. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.
1. මූක්‍යාර්ථය, ලේඛම්තුමා, සජ්ඣායනා, ශිෂ්ඨාචාරය
2. ශිෂ්ඨාචාරය, මූඛ්‍යාර්ථය, සජ්ජායනා, ලේඛම්තුමා
3. මූඛ්‍යාර්ථය, ලේකම්තුමා, ශිෂ්ටාචාරය, සජ්ඣායනා
4. මූක්‍යාර්ථය, ලේඛම්තුමා, ශිෂ්ඨාචාරය, සජ්ජායනා
5. සජ්ඣායනා, මූක්‍යාර්ථය, ශිෂ්ඨාචාරය, ලේඛම්තුමා

(.......)

3. අකාරාදි පිළිවෙල අනුව නිවැරදිව ලියා ඇති පද පේළිය තෝරන්න.
1. බෙන්තර ගඟ, මැණික් ගඟ, වලවේ ගඟ, කළු ගඟ
2. ලොග්ගල් ඔය, උමා ඔය, දැදුරු ඔය, මහා ඔය
3. අඹන් ගඟ, කුඹුක්කන් ඔය, මැණිකේ ගඟ, වලවේ ගඟ
4. දැදුරු ඔය, අඹන් ගඟ, මහා ඔය, බෙන්තර ගඟ
5. කුඹුක්කන් ඔය, උමා ඔය, මහා ඔය, ලොග්ගල් ඔය

(.......)

4. පහත සඳහන් ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. "ර" කාරයට පසුව යංශය යෙදිය හැකිය.
2. තත්සම පදවල ඊ කාරයට පසුව මූර්ධජ ණ යෙදේ.
3. "ර" ෘකාරයට පසුව යෙදෙන ණ මූර්ධජ විය යුතුය.
4. වර්තමාන කෘදන්ත පදවල ඊ කාරයට පසුව ණ යෙදේ.
5. රුවල යන පදයේ මුල් අකුරේ ඇති පිල්ලම කෙටි ඇදයයි.

(.......)

5. එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

1. විද්‍යාල භූමිය, ශක්‍ර දේවේන්ද්‍ර, රාජසභාව, ක්ෂිර සයුර
2. ක්‍රීඩා පිටිය, විදේශීය පුවත්, ව්‍යාකරණ ලක්ෂණ, නර්තන සම්ප්‍රදාය
3. චන්ද්‍ර මණ්ඩලය, බුද්ධ රුවන, විහාර මන්දිරය, සංස්කෘතික බස
4 ත්‍රිවිධ රත්නය, චූඩා මාණික්‍යය, නමෝ ගර්භය, ජංසා යුග්මය
5. රත්න දිවයින, පෙම් සයුර, මරු කතර, මන්ද මාරුතය

(.......)

6. තත්සම වචන පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

1. රත්න, සන්ධි, පියුම්, ගුප්ත
2. මාණික්‍යය, ගගන, කිරිය, ලක්ෂණ
3. පෘථිවිය, පර්වත, ගිම්හාන, වර්ෂ
4. භ්‍රමණය, ධර්ම, චර්ම, සිද්ධාර්ථ
5. නර්තනය, සිරස, උදක, මාර්ග

(.......)

7. තත්භව වචන පමණක් ඇතුළත් වරණය තෝරන්න.

1. පාසල, හිස, අහස, දහම
2. පාඨශාලාව, ගගන, නැටුම, පහණ
3. ශාසන, පවන, ගර්භ, සර්ප
4. කිරිය, සන්ධි, සර, සකුණ
5. පච්ච, හපුස්, දාරක, රක්ත

(.......)

8. අව්‍යය, ද කරාර්ථ, විශේෂණ, විභක්ති යන සමාසවලට අයත් පද පිළිවෙලින් දැක්වෙන වරණය තෝරන්න.

1. කුකවි, සඳහිරු, ඇසළ පෙරහැර, රතුමල්
2.සුමිතුරු, කිරිපැණි, සිසිල් පැන්, කමිස රෙදි
3. පොල්තෙල්, කිරිබත්, කුපුරිස්, නවදොර
4. භූමිතෙල්, අවේලාව, නිරිවින්ද, ගුරුගෙදර
5. සුදුමල්, අවිවේකී, සොරබිය, අත්පා

(.......)

9. කෘදන්ත නොවන පදයක් අන්තර්ගත වාක්‍ය තෝරන්න.

1. කරන, මරන, හාරන, වදාරන
2. බැලීම්, නැටීම්, කිරීම්, හැඩීම්
3. නැටිලි, බැලිලි, සෙවිලි, කියවිලි
4. නැටුමන්, බැලුමන්, අවමන්, හැඩුමන්
5. කෑ, දෑ, ගෑ, පද

(.......)

10. පහත සඳහන් උද්ධෘතවල තද කලු අකුරින් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙලින් දක්වා ඇති වරණය තෝරන්න.

අ. සඳ **පායන්** කුමුදු පිපේ
ආ. **කෙළිමින්** තැන තැන ලන්දූ
ඇ. තපස් **රකිනුව** වන ගතව
ඈ. ආරාධිත අමුත්තන් ශාලාවට **පැමිණ** අසුන් ගන්න

1. පූර්ව ක්‍රියා, අසම්භව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අපර ක්‍රියා
2. අපර ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා
3. පූර්ව ක්‍රියා, අසම්භව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අපර ක්‍රියා
4. මිශ්‍ර ක්‍රියා, අසම්භව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, අපර ක්‍රියා
5. අසම්භව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අපර ක්‍රියා, පූර්ව ක්‍රියා

(…….)

11. තද්ධිත නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
   1. කැබිලිති, වකුටු, සිරිමත්, රන්මුවා
   2. සිඟිති, බිතු, ශෛලමය, දියණියෝ
   3. දාරුමය, බොකුටු, වරලස්, නුවනත්
   4. ජනතා, ස්වදේශීය, දිරිමත්, කුල්මත්
   5. තෙරණුවෝ, මුගලන්, විවාහක, මධුරතම

(…….)

12. උපසර්ගයක් නොමැති පදයක් සහිත පේළිය තෝරන්න.
   1. උපනායක, සුබස, ස්වයංසේවා, අන්තර්ජාතික
   2. පබල, දුදන, සුසිරිත්, අවමඟුල්
   3. අබිමන්, අභිනිෂ්ක්‍රමණය, අනර්ඝ, සුවිශාල
   4. අතිමහත්, දුසිරිත්, පිළිසරණ, සුපිරිසිදු
   5. අනාදාර, නිරුත්සාහක, පරනිර්මිත

(…….)

13. නිපාතයක් නොවන පදයක් අන්තර්ගත පද පේළිය තෝරන්න.
   1. පිණිස, කැටුව, නොහොත්, සමඟ
   2. හෝ, සහ, විසින්, අහෝ,
   3. මෙන්, වනාහි, එම්බල, ම
   4, මහත්, අරබයා, අයියෝ, දක්වා
   5. විතර, ද, ත්, ය

(…….)

14. **උපවිදුහල්පතිතුමා ශිෂ්‍ය ශිෂ්‍යාවන්** උදෙසා **දේශානුරාගය** දනවන කථාවක් පැවැත්වීය.
   1. සමාස, උපසර්ග, සන්ධි
   2. සන්ධි, උපසර්ග, සමාස
   3. උපසර්ග, සමාස, සන්ධි
   4. සන්ධි, සමාස, උපසර්ග
   5. සමාස, සන්ධි, උපසර්ග

(…….)

15. සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.

1. කැඩිණි, කැඩුණු, වැටුණේය, බැලුවේය
2. දමා, හඬා, කරලා, දුවමින්
3. බලබලා, පැන පැන, නටනවා, අසා
4. කරන්නේය, බලන්නේය, හැඩිණි, බැලිණි
5. කරද්දී, කියත, පායන, නටද්දී

(…….)

16. සමාසයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1. අධිපති, අකුසල්, අනදර, ආදර්ශ
2. සිවුරුපිළි, බුදුගුණ, හිරුරැස්, නිලුපුල්
3. සුදු රෙද්ද, නිල්මැණිකේ, ලඹසවන්, ගිහිපැවිදි
4. සුදන, අකුසල්, බටහිර, සොර බිය
5. අටසිල්, බහුතරය, කිරිබත්, අනිටු

(…….)

17. එකම වර්ගයට අයත් සන්ධි පද අන්තර්ගත වරණය තෝරන්න.

1. පෙරාපර, කුසලාකුසල, දකුණත, සුරතින්
2. ගුරුතුමා, ගනඳුර, සුරඟන, වැටුසිපත
3. මෙහෙසිරු, දෑගසවු, නළඟන, යනෙන
4. ළිංපඬිය, පුනරුදය, සිත්තරු, අස්සන
5. කම්මල, ගංවතුර, වී යැට, රුක්කත්තන

(…….)

18. ව්‍යාකරනුකුලව නොගැළපෙන පදයක් සහිත වරණය තෝරන්න.

1. උපාසක උපාසිකාවෝ, දරුදූරියෝ, මවුපිය, ගුරුදෙගුරු
2. දූට, ගිය, රැඳුන, පැමිණිහොත්
3. වමත, සුරිඳු, මලසුන, නෙතිනඟ
4. වරලස, සවනත්,  මුහුලස්, කුහුරිස්
5. ගොස්, අවුත්, බලා, රැක

(…….)

19. ව්‍යාකරණානුකුලව නිවැරදි වැකිය තෝරන්න.

1. ඇතැමෙක් පව් කොට නිරයේ උපදිත්
2. කාර්යාලයේ ලිපිකරුවන් ඇත
3. ළමයි රාත්‍රියේ තනිවම ගමන් කිරීම නොමැනවි
4. මම ඔබ හමුවිය යුත්තේ කොතැනදී ද
5. ළමයි පොත් පාඩම් කරනිය ගුරුවරුන් සිතූහ

(…….)

20. ලේඛන ව්‍යවහරයට වඩාත් සුදුසු වාක්‍ය සහිත වරණය තෝරන්න.

1. මේ කන්නයේ ගොවින්ගේ අස්වැන්නට ඉහළ මිලක්.
2. ක්‍රීඩිකාවෝ වහා වහා ක්‍රීඩාපිටියට පැමිණෙති.
3. වේදිකාවේ ගී ගයන්නේ නිරෝශාය.
4. මොකද ළමයෙක් පැත්තකට වී කරන්නේ?
5. කියන්න කියන දෙයක් ඇයිද ඉන්නේ තාම බලා.

## 11 කොටස

- මෙම කොටසින් **2,3 ප්‍රශ්න ඇතුලුව හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

2. ප්‍රශ්න අංක 2

(අ) ආර්ථික වර්ධන වේගය තිරසර ලෙස පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මානව ප්‍රාග්ධන පදනම බිහි කිරීමෙහි ලා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය සැලකිය යුතු ලෙස නවීකරණයට ලක් විය යුතු බව පැහැදිලිව හඳුනාගෙන ඇත. අධ්‍යාපනයේ නිසි ප්‍රතිලාභ ලැබෙනුයේ අධ්‍යාපන සේවා ශ්‍රම වෙළඳපොළ අවශ්‍යතාවන්ට ගැළපුණහොත් පමණි. එම නිසා අධ්‍යාපන ක්‍රමය විභාග මූලික කරගත් විෂය කරුණු මත පදනම් වූ විෂය මාලාවලින් පරිබාහිරව ශිෂ්‍යයන්ට ජීවිතයට අවශ්‍ය කුසලතා සහ ස්වාධීන ව සිතීමේ හැකියාව ලබාදෙන ආකාරයෙන් නිපුණතා මත පදනම් වූ විෂය මාලාවක් බවට වෙනස් කළ යුතුව තිබේ. විශ්ව විද්‍යාල පද්ධතිය තුළ සිදු කරන ප්‍රතිසංස්කරණ මඟින් ශ්‍රම වෙළඳපොළ අවශ්‍යතා සහ උපාධිධාරීන්ගේ කුසලතා අතර පවතින නොගැළපීම අඩු කළ යුතු අතර එය තරුණ කොටස් අතර සේවා වියුක්තිය හා ඌන සේවා නියුක්තිය අඩු කිරීමට හේතුවනු ඇත. රජය උසස් අධ්‍යාපනය සඳහා කරනු ලබන ආයෝජන ප්‍රමාණය ඉහළ ගියද ශ්‍රී ලංකාවට දැනුමේ කේන්ද්‍රස්ථානයක් ලෙස නැගී සිටීමට නම් පෞද්ගලික අංශය සමඟ ඒකාබද්ධව ආයෝජන ධෛර්යමත් කිරීම මඟින් අධ්‍යාපන අංශය වැඩි දියුණු කළ යුතුව ඇත. අන්තර්ජාල පහසුකම් ඔස්සේ ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ජාත්‍යන්තරයට ඉදිරිපත් කිරීම ජාත්‍යන්තර විශ්ව විද්‍යාල සමඟ ඒකාබද්ධව ශිෂ්‍යයන් හා කාර්ය මණ්ඩල හුවමාරු කිරීමේ වැඩසටහන් පශ්චාත් උපාධි පාඨමාලා විදේශීය සිසුන් සඳහා විවෘත කිරීම මෑතකදී උසස් අධ්‍යාපන අධිකාරීන් විසින් අනුගමනය කරන ලද ප්‍රශස්ත ක්‍රියා මාර්ග වේ. මේ අතරම ශ්‍රී ලංකාවේ දැනට පවත්නා සමහර වෘත්තීය පුහුණු ආයතන තරුණ කොටස් අතර සේවා වියුක්තිය යම්තාක් දුරකට අඩු කිරීමට හේතු වී ඇති අතර විශ්ව විද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් නොලබන ශිෂ්‍යයන් පාසල් අධ්‍යාපනයෙන් පසුව රැකියාවක් සඳහා යොමු කිරීමට පහසුකම් සලසන ආකාරයෙන් එම ආයතනය සැලකිය යුතු ලෙස ව්‍යාප්ත විය යුතු ව ඇත. අධ්‍යාපනය වසරකින් දිගු වීම හේතුවෙන් අත්වන ආන්තික ප්‍රතිලාභය තාක්ෂණික හා වෘත්තීය පුහුණු අධ්‍යාපනය සම්බන්ධයෙන් ද ඉතා ඉහළ අගයක් ගන්නා බැවින් මෙම තාක්ෂණික හා වෘත්තීය පුහුණු අවශ්‍යතා තවදුරටත් වැඩි දියුණු කිරීම ධෛර්යමත් කළ යුතු ව තිබේ.

1. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය නවීකරණය විය යුත්තේ කුමක් සඳහා ද?
2. නිසි ප්‍රතිලාභ ලබා ගැනීමට අධ්‍යාපනය සකස් විය යුත්තේ කෙසේ ද?
3. සේවා වියුක්තිය හා ඌන සේවා නියුක්තිය අඩු කිරීමට කුමක් කල යුතු ද?
4. ශ්‍රී ලංකාව දැනුමේ කේන්ද්‍රස්ථානයක් ලෙස නැගී සිටීමක් සඳහා ගත යුතු පියවර ලෙස යෝජනා කරන්නේ කුමක් ද?
5. තාක්ෂණික හා වෘත්තීය පුහුණු අවශ්‍යතා වැඩි දියුණු කිරීම ධෛර්යමත් කළ යුත්තේ ඇයි?

(ආ) සාරාංශය

තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා සාරාංශය අග වචන සංඛ්‍යාව සඳහන් කරන්න.

ආර්ථික විශ්ලේෂණයේ දී වෙසෙසින් උපුටා නො දක්වෙන නමුත් සංවර්ධනයේ දී අතිශයින් වැදගත් වන තවත් සැලකිය යුතු කරුණක් නම් අධ්‍යාපනය සමාජ වෙනස්වීම සඳහා සාධකයක් ලෙස බලපවත්නා ආකාරයයි. සංවර්ධනයේ දී පාරම්පරික සමාජ ව්‍යුහයේ පරිණාමයත් අවශ්‍ය වෙයි. තවද, ඒ සඳහා වැඩි වේගවත් සමාජ චලතාවක් ද, නව්‍යකරණයට බාධක වන සිරිත් විරිත් හා ඇගයීම බැහැර කිරීම ද අවශ්‍ය වෙයි. මේ වෙනස්වීම් ඇති කර ලීමෙහි ලා අධ්‍යාපනය බලවත් උපකරණයකි. අලුත් අදහස් පැතිරවීමෙන් ද, අලුත් උසස් සමාජ පන්ති පෝෂණය කරලීමෙන් ද මුළු සමාජය පුරාම නායකත්වය පිළිබඳ විවිධ රටාවන්හි වෙනස්කම් එයින් ජනිත කෙරේ. ක්‍රම සම්පාදකයෝ සංවර්ධනය හා සම්බන්ධ සමාජ හා දේශපාලන සාධක දන්නා තරමට ම, සමාජ වෙනස්වීම ඇති කරලීමේ මාධ්‍යයක් වශයෙන් අධ්‍යාපනයේ ඇති වැදගත්කම ගැන ද දැන ගත යුත්තෝ ය.

අධ්‍යාපනය ශුභසාධන අංගයක් වශයෙන් නො ව සංවර්ධනයෙහි ලා අතිශයින් උපකාරී වන්නක් සේ අද සැලකෙන්නේ නම්, එය ප්‍රබල සහ කාර්යක්ෂම ආයුධයක් බවට පත් කරගත යුතු ය. මෙයින් අදහස් කෙරෙන්නේ අධ්‍යාපනය මුළුමනින් ම වාගේ සංවර්ධන පරමාර්ථයේ අවශ්‍යතා අනුව හැඩගස්සා ගත යුතු බව යි. මූලික වශයෙන් මේ අවශ්‍යතා දෙයාකාර වෙයි. සංවර්ධනයේ උසස් තලවල දී ආර්ථිකය සඳහා අවශ්‍ය වන විශේෂ දක්ෂකම් ඇතියවුන් නියත වශයෙන් ලබා දීම ඉන් පළමු වැන්න වේ. නවීන කාර්මික ඥානය ගැන ජනතාව තුළ පිළිගැනීමක් මෙන් ම නවීන වූත්, විද්‍යාත්මක වූත් හැඟීමක් ඇතිකර ගැනීමත් සමඟ ම සංවර්ධන අරමුණු හා ගැලපෙන අදහස් උදහස් ඇති කිරීම දෙවැන්න වේ. දෙ වැනි අවශ්‍යතාව ඉතා ම වැදගත් වෙයි. කුමක් හෙයින් ද යත්, සංවර්ධනය සඳහා යොදන ප්‍රාග්ධන ප්‍රමාණයට වඩා සාමාන්‍යයෙන් ජනතාව ලබාගන්නා කාර්මික දැනීම් ප්‍රමාණය මූලික වන හෙයිනි. (ලකුණු 13 යි)

3. පහත සඳහන් මාතෘකා අතුරින් එකක් තෝරා ගෙන වචන 300-500 වන පරිදි රචනාවක් ලියන්න.

1. නූතන ජන සන්නිවේදන මාධ්‍යය හා ලාංකික සමාජය
2. සංවර්ධනය වන රටකට අවැසි ශ්‍රම බලකාය බිහිකිරීමේලා අධ්‍යාපනයේ කාර්ය භාරය
3. ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය නිවාරණය පිණිස ජාතික වැඩපිළිවෙළක අවශ්‍යතාව
4. අද්‍යතන බුද්ධිගලනය ගැටලුව හේතු කොට ගෙන අනාගත ශ්‍රී ලංකාවේ මතුවිය හැකි ගැටලු
5. සාරධර්ම සෝදා පාළුව නිසා අතරමං වන අපේ තරුණ පරපුර

4.

(අ) පහත සඳහන් වාක්‍ය වල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

1. බුද්ධිමත් ශිෂ්‍යයා හැම විටම දක්ෂ විචාරකයෙකු ද වෙයි.
2. නව කර්මාන්ත ශාලාවක් හෙට දින නගර මධ්‍යයේ විවෘත කරයි.
3. දැරියක් මැහැල්ලක දැක බිය වූවාය.
4. මම උත්සහාවන්තයෙක් වේවා!

(ඇ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

1. වැද්දා හාවෙකු ද මුවෙකු ද මරයි.
2. වෘකයා බැටළුවන් ලුහුබැන්දේය.
3. පොළොන්නරු යුගයේ දී ගුරුළුගෝමිහු අමාවතුර රචනා කළහ.
4. භාෂාවේදියෝ නව භාෂා රීතීන් හඳුන්වා දෙති.
5. අම්මා මාද නංගී ද හොඳින් රැකබලා ගත්තාය.

(ඈ) නිවැරදි වැකියක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

1. (නළුවෙක් /නළුවෙකු) ලෙස ජනප්‍රිය වූ ඔහු දක්ෂ (රචකයෙක් /රචකයෙකු) ද වෙයි.
2. කාර්යාල ප්‍රධානියා (සේවකයෝ / සේවකයන්) රැස්වීමට (කැඳෙව්වෝය / කැඳෙව්වේය).
3. (පැරකුම්බාවෝ / පැරකුම්බාවන්) පරාක්‍රම සමුද්‍රය නිර්මාණය (කළාහුය / කළේය).
4. ඇතැම් (ශිෂ්‍යයෝ / ශිෂ්‍යයන්) පුරාණ සාහිත්‍ය කෘති කියවීමට රුචියක් (දක්වයි /දක්වති).
5. ගීත (රචකයෝ / රචකයන්) වනාහි අසිරිමත් සිතුවිලි (මවන්නෝ / මවන්නන්) යැයි හඳුන්වා දෙති.

5.

(අ) පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංග දක්වා ඇත ඒවායේ අනු අංග දක්වන්න.

1. අභ්‍යවකාශයේ රැඳී **සිටිමින් ඉසුරුමත්** අනාගතයකට පර්යේෂණවල නිරතවන්නන් අපේ **ගෞරවාදරයට** ලක් විය යුතුය.

   (සිටිමින් - ක්‍රියා, ඉසුරුමත් - තද්ධිත, ගෞරවාදරයට - සන්ධි)
2. **විලෙහි** පිපි **සියපත්** වටා **රඟන** බිඟුන්ගේ නද සවන් සනහාලයි

   (විලෙහි - විභක්ති, සියපත් සමාස, රඟන - කෘදන්ත)
3. **සුම්හිරි** වීණා නාදයෙන් මත්වූ කිඳුරෝ චන්දිභට්ටයන් **මෙන් කතා කරද්දී** අශ්වයෝ ප්‍රතිමා රූප මෙන් සිටියහ.

   (සුම්හිරි - උපසර්ග, මෙන් - නිපාත, කතාකරද්දී - ක්‍රියා)
4. රටේ **අභිවෘද්ධිය** වෙනුවෙන් වැඩ **කරන** ජනතාව දෙවියෝ **රකිත්වා!**

   (අභිවෘද්ධිය - උපසර්ග, කරන - කෘදන්ත, රකිත්වා - ක්‍රියා)
5. දරුවෝ **ඔවුනොවුන්** දෙස **බලා බොකුටු** කොණ්ඩය කපා ගත්හ.

   (ඔවුනොවුන් - සන්ධි, බලා - ක්‍රියා, බොකුටු - තද්ධිත)

(ආ) පහත දැක්වෙන වාක්‍ය වල හිස්තැනට වඩාත්ම ගැලපෙන පදය වරහන් තුල දී ඇති පද අතුරින් තෝරා ලියන්න.

(භාෂා /මණ්ඩලය /ප්‍රදානය /මඩුලු /ප්‍රධාන /බස)

1. ගඟ දෙපස මලින් සැදි ගිය ලිය .......................... කැරගල ප්‍රදේශය අලංකාර කළේය.
2. අනගාරික ධර්මපාල විද්වතාණෝ දෙස ............................ සුරැකීමේ ව්‍යාපාරයේ පුරෝගාමියා වූහ.
3. සංස්කෘතික පාලි ....................... සිංහල භාෂාව සුපෝෂණය කිරීමට ඉවහල් විය.
4. පිනිවාහි පැවැත්වෙන සමුලුව සඳහා අමාත්‍ය .......................... දිවයිනින් පිටත් වේ.

5. නිදහස් දිනය සැමරීමේ ……………………උත්සවය මෙවර අතිඋත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට කටයුතු කර ඇත.
6. මෙවර විශ්ව විද්‍යාලීය උපාධි ………………… බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණි.

(ඇ). පහත දක්වා ඇති පද සන්ධි කර ලියන්න.

1. පරි + ඊක්ෂණ
2. වාත් + ආඩම්බර
3. කාල + අනුරූප
4. නෙඩු + මල්
5. ඇත් + හමු
6. වී + ඇට

(ඈ). තද කළුඅකුරින් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

1. වී **පැදුරෙන්** ඉඟිලී යන **කුරුල්ලෙකු ලෙසින්**
2. **පාලකයිනි,** කම්කරු **ජනතාවගේ** අයිතීන් සුරකිනු මැනවි.
3. මාර්ටින් **වික්‍රමසිංහයන් විසින්** රචනා කරන ලද යුගාන්තය **පාඨකයාට** සමාජ යථාර්ථය පිළිබඳව නවමු අත්දැකීමක් ලබා දුන්නකි.

(ඈ).අවශ්‍ය තැන් වලට විරාම ලකුණු යොදා පහත දැක්වෙන වාක්‍ය නැවත ලියන්න.

1. දරුවෙනි මෙහෙම නොකරන් නුඹේ අම්මාට
2. දෙමාපිය දූදරු සබඳතාවය ආරක්ෂා වන්නේ එකිනෙකාට යුතුකම් ඉටු කිරීමෙන් බව සිඟාලෝවාද සූත්‍රයේ ඉගැන්වෙයි
3. අහෝ මේ කිමෙක්දැයි කට ඇරගත් වහාම කේවට්ටයා උඩ බැලීය

(ඉ) පහත දැක්වෙන ප්‍රකාශන වල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

1. හෙට දිනයේ පැය අටක් මහරගමට වතුර කපනවායැයි ජල මණ්ඩලය මහජනතාවට ප්‍රකාශ කළේය.
2. මල්ලී අඹ ගසින් බහින්න අක්කා පවසයි.
3. උඹෙ ඔය බෙලසුළු ස්වභාවය ගැහැණියක් නිසා නේදැයි අසංගයෝ නයනානන්දගෙන් විචාලහ.

6. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඓතිහාසික සාහිත්‍යයෙහි ආධාරය නොමැතිව හුදෙක් සෙල්ලිපි ම පදනම් කොට ගෙන මෙරට අධ්‍යාපනික ප්‍රතිපත්ති හා ව්‍යවහාරය පිළිබඳව ක්‍රමානුකූලව වෘත්තාන්තයක් ඉදිරිපත් කළ නොහැකි තරම් ය. බෞද්ධ විහාරස්ථානය සාමාන්‍යයෙන් ශාස්ත්‍රෝද්ග්‍රහණස්ථානය විය. මෙහිදී බෞද්ධ ශික්ෂාපද සහ වත් **පිළිවෙත්** පමණක් නොව අධ්‍යාපනයට අයත් **ලෞකික විෂයයන්ද** සැලකිල්ල ලද්දේය. **ශිෂ්‍යයනට** විඳින්නට සිදු වූ දුක් කරදර නොතකා හුදෙක් තමනට සැලසෙන අභිවෘද්ධිය ම තකා මහත් උද්යෝගයෙන් හා උනන්දුවෙන් **අනුරාධපුරයෙහි** මේ අධ්‍යාපන ආයතනයන්ට ශිෂ්‍යයන් ඇතුළු වීම වූකලී ඒවායෙහි විශිෂ්ටත්වය හුවා දක්වන ප්‍රත්‍යක්ෂ සාධකයකි. බුද්ධ ධර්මය රාජ්‍යාගම ලෙස ප්‍රතිෂ්ඨාපිත වූ පසු **මහජනයා** බෞද්ධ දිවිපෙවෙත පිළිගෙන ඒ අනුව ජීවත් වූහ. **මනුෂ්‍යයන්ගේ** පමණක් නොව කෘමි, සිවුපා, සියොත් ආදීන්ගේ ද ජීවිතය අගය කිරීමට ඉගැන්වීමෙන් බුදු සමය ක්ෂුද්‍රතම ජීවියෙකුට පවා ස්වභාව **ධර්මයෙන්** ඉඩ ලැබෙන තාක් ජීවත් වීමට ඇති ඒකාන්ත අයිතිය පිළගත්තේය. බුදු සමය වැළඳ ගත් සැදැහවතුනට උගන්වන ලද්දේ දෙව් මිනිස් සත්ත්ව හැම කොට්ඨාසයක් ම සංසාර චක්‍රයෙහි බැඳී ඇති බවයි.

1. ඡේදයේ තද කළු අකුරින් මුද්‍රිත වචන අකාරාදී පිළිවෙලට සකස් කර ලියන්න.
2. ඓතිහාසික අභිවෘද්ධිය බෞද්ධ යන වචනවල යෙදී ඇති පිලි වෙන වෙනම ලියන්න.
3. ඉහත ඡේදයෙන් උපුටා දක්වන්න.
   - ❖ අල්පප්‍රාණ අක්ෂරයක් සහ සඤ්ඤක අක්ෂරයක් එන ළඟ යෙදී ඇති වචනයක්
   - ❖ මූර්ධජ අක්ෂරයක් සහ මහප්‍රාණ අක්ෂරයක් යෙදුනු වචනයක්
   - ❖ මහප්‍රාණ අක්ෂරයක් සහ දන්තජ අක්ෂරයක් පිළිවෙලින් යෙදුනු වචනයක්

4. පහත සඳහන් පදවල තද්ධිත ප්‍රත්‍යය වෙන්කොට තද්ධිත නාමය ලියන්න.
5. උපසර්ග පද තුනක් ඡේදයෙන් උපුටා දක්වන්න.

10. පහත සඳහන් මාතෘකා අතුරෙන් තුනකට කෙටි සටහන් ලියන්න.
   1. මහාප්‍රාණාක්ෂර
   2. අසම්භාව්‍ය ක්‍රියා
   3. ස්වරාදේශ සන්ධිය
   4. විශේෂණ සමාමය
   5.වත් මත් ප්‍රත්‍යය භාවිතය

(ලකුණු75)